''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; II කලාපය; 2023 නොවැම්බර්; පිටු: 11-16

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකයක් ලෙස ස්ත්‍රීත්වයට ආවේණික වූ දුක්ඛයන්ගේ බලපෑම (බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සිදු කරන අධ්‍යයනයක්)

ඩබ්. ඩී. අයි. සී. වීරසිංහ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
idushachamika@gmail.com

**සංක්ෂේපය**

මානව වර්ගයාගේ ඒකත්වය ජීවවිද්‍යාත්මක සාධකය තුළ තර්කානුකූලව තහවුරු කරන බුදුදහම, මනුෂ්‍යයා විභේදනය කළ හැකි වනුයේ ස්ත්‍රී-පුරුෂ ලෙස ද්විවිධ ව පමණක් බව පෙන්වා දී ඇත. එම පදනම මත වත්මන් 'ස්ත්‍රී-පුරුෂ සමාජභාවය' සංකල්පය පිළිබඳ විමර්ශනය කිරීමේ දී අද්‍යතන පර්යේෂණ ක්ෂේත්‍රය අවධාරණය කරන ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකයක් ලෙස ස්ත්‍රියකට පමණක් ආවේණික වූ දුක්ඛ ස්වාභාවයන්ගේ බලපෑම හඳුනාගත හැකි ය. ඒ මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක ද ආභාසයෙන් වීම විශේෂත්වයකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකයක් ලෙස ස්ත්‍රීත්වයට ආවේණික වූ දුක්ඛයන්ගේ බලපෑම කෙබඳු ද ? යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍රිතව රචිත මෙම ශාස්ත්‍රීය ලිපිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විෂයෙහි ස්ත්‍රීත්වයට අනන්‍ය වූ එම දුක්ඛයන්ගේ ඍජු බලපෑම අවධාරණය කිරීමත් බුදුදහමේ අන්තර්ගත ඉගැන්වීම්හි ප්‍රායෝගික වූ සුවිශේෂී ආවේණිකත්වය තහවුරු කිරීමත් අරමුණු කොට ගනිමින් රචනා වූවකි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ආවේණිකදුක්ඛ සූත්‍රය හා ලිපියෙහි තේමාව හා සබැඳි ද්විතීයික මූලාශ්‍රයන් පුස්තකාල පරිශීලන ක්‍රමය යටතේ භාවිත කරමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව අදාළ දත්ත රැස් කර ඇත. බුදුදහමේ ප්‍රායෝගිකත්වය විද්‍යාත්මකව තහවුරු වෙමින් පවතින යුගයට කාලීන උපයෝගීත්වයක් ඉස්මතු කරන මෙම ශ්‍රාස්ත්‍රීය වෑයම වත්මන් පර්යේෂණ ක්ෂේත්‍රයට එක් වූ නව්‍යතම පර්යේෂණාත්මක තේමාවක් ලෙස ද හඳුන්වා දිය හැකි ය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකයක් ලෙස ස්ත්‍රීත්වයට ආවේණික දුක්ඛයන් බලපැවැත්වෙන බව නිගමනය වන මෙමගින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ යථාර්ථවාදී වූ අවබෝධාත්මක දෘෂ්ටියක් ගොඩනඟා ගැනීමට දායකත්වය සැපයීම සිදු වේ.

**මුඛ්‍ය පද:** ආවේණික දුක්, බුදුදහම, මනෝවිද්‍යාව, ස්ත්‍රීත්වය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය

## හැඳින්වීම

අද්‍යතන පර්යේෂණ ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ අවධානයක් යොමු වන විෂය ක්ෂේත්‍රයක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හඳුනාගත හැකි ය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, නන්විධ දෘෂ්ටිකෝණයන් ඔස්සේ විග්‍රහ වී ඇති පුළුල් විෂය පරාසයකි. එසේම මේ මොහොතේදීත් විවිධ පර්යේෂණ තේමාවන් යටතේ නව්‍යකරණය වෙමින් පවත්නා කාලීන අධ්‍යයන ක්ෂේත්‍රයකි. '*Gender*' යන්න බොහෝ අධ්‍යයනයන්හි දී භෞතිකමය දෘෂ්ටියකින් විග්‍රහ වී තිබෙනු දැකගත හැකි ය. නමුත් ස්ත්‍රියත් පුරුෂයත් අතර වූ වෙනස විද්‍යමාන වනුයේ භෞතික තත්ත්වයක පදනමක් මත පමණක් ම නොවේ. ඇතැම් අධ්‍යයනයන්හි දී මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි මනෝවිද්‍යාත්මක දෘෂ්ටියක් යොමු කළ අවස්ථාවන් ද හමු වේ. ඒවා පිළිබඳ වැඩිදුර අධ්‍යයනයේ දී සැබැවින් ම ඇතැම් මනෝවිද්‍යාත්මක සාධකයන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විෂයෙහි ප්‍රබලව බලපැවැත්වෙන බව තහවුරු කරගත හැකි ය.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මනෝවිද්‍යාත්මක තත්ත්වයන්ගේ ප්‍රතිඵලයකි

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හුදෙක් ලිංගිකත්වය මත පමණක් ම තීරණය වන්නක් නොවේ. ඊට හේතු වන අවශේෂ සාධකයන් මනෝවිද්‍යාත්මක තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අර්ථවත් වේ. මේ පිළිබඳ තහවුරු කර ගැනීමට යෝග්‍යත ම මූලාශ්‍රය බුදුදහමින් ප්‍රකට වේ. බුදුදහම, වඩා සූක්ෂම අයුරින් ස්ත්‍රී හා පුරුෂ යන ස්වභාවයන්ගේ මූලයට (ස්ත්‍රියක්

ලෙස හෝ පුරුෂයෙක් ලෙස සිදු වන උපත සඳහා) ද 'ගන්ධබ්බ' ('*Gandhabba*') (''***...ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති...***'') නම් අභෞතික තත්ත්වය හා එහි අන්තර්ගත මනෝවිද්‍යාත්මක තත්ත්වයන්ගේ ප්‍රබලත්වය ම බලපැවැත්වෙන බව හේතුඵලවාදී විග්‍රහයක් මත මනාව විවරණය කර ඇත. එම පසුබිම මත මෙම ලිපිය මගින් අපේක්ෂා කරනුයේ ස්ත්‍රියකට පමණක් ම ආවේණික වූ දුක්ඛදායක තත්ත්වයන් මත ජනිත වන මනෝවිද්‍යාත්මක ස්වාභාවයන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තීරණය කරන්නා වූ ප්‍රබල සාධකයක් වන ආකාරය පිළිබඳව විමර්ශනය කිරීම ය. කාලීන වශයෙන් ද වැදගත් වූ පර්යේෂණ තේමාවක් යටතේ සංයුත්ත නිකායේ ආවේණිකදුක්ඛ සූත්‍රය ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කෙරේ.

'***ඉත්ථි***' යන්නෙන් ස්ත්‍රීත්වයත් (*Femininity*) '***පුරිස***' යන්නෙන් පුරුෂත්වයත් (*Masculinity*) ව්‍යවහාර කරන බුදුදහම, මවක්, භික්ෂුණියක්, බිරිඳක්, සහෝදරියක්, මිතුරියක්, සේවිකාවක් ලෙස පමණක් නොව මනෝමය සංවර්ධනයෙහි උපරිමත්වය තුළ අර්ථවත් වන 'අරහත්වය' නම් වූ උත්තරීතර භූමිකාව තුළ ස්ත්‍රීත්වය ගෞරවණීයත්වයටත් පූජනීයත්වයටත් බඳුන් කොට ඇත. සංයුත්ත නිකායේ මාතුගාම සංයුත්තයේ මාතුගාම වග්ගයෙහි එන ආවේණිකදුක්ඛ සූත්‍රය මගින් යථෝක්ත ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විෂයෙහි තීරණාත්මක දායකත්වයක් සැපයෙන අයුරු හඳුනාගත හැකි ය.

ආවේණික දුක්ඛ සූත්‍රයට අනුව ස්ත්‍රියකට පමණක් ආවේණික වූ දුක්ඛදායක තත්ත්වයන් පංචකයකි. ''***පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස ආවෙණිකානි දුක්ඛානි යානි මාතුගාමො පච්චනුභොති අඤ්ඤත්‍රෙව පුරිසෙහි...***'' ඒවා,

යොවුන් වියේදී ම මව්පිය, ඥාතීන්ගෙන් දුරස් වීමට සිදු වීම (''***...මාතුගාමො දහරොව සමානො පතිකුලං ගච්ඡති, ඤාතකෙහි විනා හොති.***'')

- ඔසප් වීම ('' ***...මාතුගාමො උතුනී හොති...***'')
- ගැබ් ගැනීම ('' ***...මාතුගාමො ගබ්භිනී හොති...***'')
- දරුවන් වැදීම (දරු ප්‍රසූතිය) ('' ***...මාතුගාමො විජායති...***'')
- ස්වාමියා අනුගමනය කිරීමට සිදු වීම ('' ***...මාතුගාමො පුරිසස්ස පාරිචරියං උපෙති...***'')

යනාදී ලෙස පෙන්වා දිය හැකි ය.

මේ සියල්ල පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ලිංගිකත්වය මත පමණක් ම නිර්වචනය කිරීමට වෑයම් කරන ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, එම ලිංගිකත්වය ඉක්මවූ මනෝවිද්‍යාත්මක තත්ත්වයන් ජනිත වීමත් එම මනෝවිද්‍යාත්මක ප්‍රතිඵලයන් ස්ත්‍රියත් පුරුෂයාත් අතර ස්ත්‍රීත්වය සහ පුරුෂත්වය ඉක්මවූ අභෞත්ක පරස්පරතාවයන් විද්‍යමාන කරන්නට තරම් ප්‍රබල වන බව පැහැදිලිව ම හඳුනාගත හැකි ය.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකය**

විමර්ශනාත්මක දෘෂ්ටියක් යොමු කිරීමේ දී ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකයක් ඉස්මතු වනුයේ ඔසප් වීමත් ගැබ් ගැනීමත් දරු ප්‍රසූතියත් නිසැකව ම ජීවවිද්‍යාත්මක ලක්ෂණ ප්‍රකට කරන බවයි. එමෙන් ම මව්පිය, ඥාතීන්ගෙන් දුරස් වීම හා ස්වාමියා අනුගමනය කිරීමට සිදු වීම ස්ත්‍රී ජන්මයෙහි උරුමයන් ලෙස හඳුනාගත හැකි කාරණාවන් ය. පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය, අසහාය වූ චිත්තවේගීය ශක්තියකින් අර්ථවත් කරන්නට මෙම සාධකයන් හේතු වන ආකාරය, ස්ත්‍රිය සම්බන්ධයෙන් මනෝවිද්‍යාත්මකව පුළුල් දෘෂ්ටියක් යොමු කළ ඉගැන්වීම් තුළින් සනාථ කරගත හැකි ය. සෑම අවස්ථාවකදී ම බුදුදහම, ස්ත්‍රිය ලිංගිකමය සාධකය තුළ සිර නො කොට මානසික දියුණුවෙහි සංවර්ධනීය තත්ත්වයන් ස්පර්ශ කරන්නට සමර්ථ වූ ශක්‍යතාවයක හිමිකාරියක් ලෙස විවෘත අර්ථකථනයකට බඳුන් කරනුයේ ඒ හේතුවෙන් ය.

ඔසප් වීම, ස්ත්‍රියක් වැඩිවිය පැමිණීමත් සමග උරුම වන්නකි. දියණියක් මල්වර වීමත් සමග ඇය තුළ භෞතිකමය වෙනස්කම් මෙන් ම අභෞතික වූ චිත්තවේගීමය වශයෙන් ද ප්‍රකම්පන තත්ත්වයන් ඇති කරයි. පුරුෂයාගේ අත්දැකීමට ගෝචර නො වන ඔසප් තත්ත්වය, කාන්තාවකගේ ජීවවිද්‍යාත්මක ස්වාභාවයක් වේ. ආවේණික දුක්ඛයක් උරුම කරමින් ඒ තුළ, ස්ත්‍රිය වඩාත් ධෛර්යවන්ත, ඉවසීමෙන් යුතු හා දරාගැනීමේ ශක්තියෙහි සංකේතය වශයෙන් හඳුන්වා දීමට තරම් ප්‍රබල මනෝමය අභිප්‍රේරණාත්මක තත්ත්වයක් ඇති කරයි. ඔසප් වීම නිසා ද නොයෙක් විට කාංසාවන් තත්ත්වයන් මෙන් ම භීතිකාමය තත්ත්වයන් නිර්මාණය විය හැකි ය. නමුත් ඔසප් වීම හේතුවෙන් ද ස්ත්‍රිය වඩාත් උපේක්ෂාවෙන් වේදනා දරා ගනිමින් ස්වකීය දෛනික කටයුතු සමබරව

පවත්වා ගැනීම පිණිස ක්‍රියා කරනුයේ තමාට හිමි වූ දුක්ඛදායක තත්ත්වයන්ට අභියෝග කරමිනි.

ගැබ් ගැනීම ද ස්ත්‍රීත්වයට අනන්‍ය වූ ස්වභාවයකි. විශ්වීය වන්දනීය හා ගෞරවාන්විත මෙන් ම උත්තරීතර වූ මාතෘත්වය හිමි වනුයේ ගැබ් ගැනීමකින් පසුව ය. එම උත්තුංග පදවියෙන් කිරුළු පළඳින්නට වරම් ලබනුයේ අසීමිත කැපකිරීම් සමුදායක හා ජීවිතයෙන් තවත් ජීවිතයක් දරාගෙන උපේක්ෂා සහගත සිනහ මුසු මුහුණින් සියලු දුක් සඟවා ගනිමිනි. සුවිශේෂත්වයක් ද එක් කරමින් ගැබ් ගැනීම කරණ කොට කාන්තාවකගේ චිත්තවේගීය රටාව වඩාත් ක්‍රමානුකූලව යහපත් චිත්තවේගීය ලක්ෂණයන්ගේ සංවර්ධනය සිදු වනුයේ, ඇතැම් විටෙක පුරුෂ චිත්තයක උපදවා ගැනීම දුෂ්කර වූ කරුණාව, මෛත්‍රිය, ඉවසීම, උපේක්ෂාව, පරාර්ථකාමීත්වය වැනි සාධු ගුණයන්ට පාරාදීසයක් වෙමිනි. ප්‍රේමයේ අසීමිත බව විශද කරමින් ස්ත්‍රියක් තමාට ආවේණික වූ දුක්ඛදායක තත්ත්වයන් මගින් ලොවට සිනහවත් ජීවයත් දායාද කරයි.

ස්ත්‍රීත්වයට ආවේණික වූ තවත් දුක්ඛිත තත්ත්වයක් බුදුදහම පෙන්වා දෙයි. ඒ දරු ප්‍රසූතියයි. ස්ත්‍රියගේ ජීවවිද්‍යාත්මක දුක්ඛ ලක්ෂණයක් වූ දරු ප්‍රසූතිය, ස්ත්‍රීත්වයේ ප්‍රබලත්වයත් පුරුෂ ශක්තිය ඉක්මවූ අසීමිත චිත්තවේගීය ශක්තියත් පිළිබිඹු කරන්නකි. එමෙන් ම දරු ප්‍රසූතිය යනු ස්ත්‍රීත්වයේ අනන්‍ය අපූර්වත්වය ප්‍රකට කරන්නා වූ විශ්මිත ක්‍රියාවලියක් ද වේ. දරු ප්‍රසූතියක් තුළ ස්ත්‍රිය, මෙලොව දරුණුතම, භයානක ම සහ සුන්දර ම වේදනාව විඳී. ස්ත්‍රියට පමණක් උරුම වූ එය පුරුෂයෙකුට සිතීමටවත් නො හැකි අසීමිත වේදනාවකි. එය සැබැවින් ම ජීවිතයත් මරණයත් අතර සටනකි. රෞද්‍ර වේදනාත්මක තත්ත්වයන් ක්ෂණයෙන් දුරස් කර කඳුළු අතරින් සිනාසෙන්නට වෙර දරන කාන්තාවගේ චිත්තවේගීය ලක්ෂණයන් ඉස්මතු වන අවස්ථාවක් ලෙස මෙය හඳුනාගත හැකි ය.
මෙලොව ත්‍රාසජනක ම වේදනාව හා අත්දැකීම විඳින ඇය අනෙක් අතට ලොව ගෞරවණීය ම හා පූජනීය ම පදවිය හිමිකර ගනී. ඇය වගුරුවන්නේ සතුටු කඳුළු ය. ඇගේ මානසිකත්වය, අසීමිත ප්‍රේමයට දිවි පුදන්නට තරම් නම්‍යශීලී ය. ඇයගේ චිත්තවේගයන්, බාහිරව අර්ථකථනය වන සියුමැලි, ළඳ බොළඳ ස්වාභාවයන් ඉක්මවූ ශක්තිමත් අකම්පිත ස්වාභාවයකට හැඩගැසීම සිදු වේ. ඇය අත්විඳිනුයේ වේදනාත්මක ම අත්දැකීමයි. නමුත් ලොවට දායාද කරනුයේ ප්‍රාණයයි. කඳුළ අතරින් සිනාසෙන දරාගැනීමේ ශක්තියයි. එපමණක් ද නොව අප්‍රමාණ ප්‍රේමයේ හෘදයාංගම සංකේතයයි. තම ජීවිතයෙන් තවත් ජීවිතයක් උත්පාදනය කරන්නට තරම් අපූර්ව ජීවවිද්‍යාත්මක සැකැස්ම උරුම වී ඇත්තේ කාන්තාවකට පමණ ය. එය බුදුදහමින් විවරණය කර ඇත්තේ ස්ත්‍රී ජන්මයට හිමි වන බලවත් ම වේදනාත්මක වින්දනයක් ලෙසිනි. එනමුදු එය කර්ම ශක්තියට පවා අභියෝග කරනුයේ බුදුදහම තුළ කාන්තාවට මනස දියුණු කර පුරුෂයා හා සම තත්ත්වයටත් පුරුෂයා ඉක්මවූ අධිගමයන්ටත් අවසානයේ අරහත්වය පසක් කර ගැනීමේ ශක්‍යතාවෙන් උපයුක්ත වීර්යයක් පවත්නා බව විවරණය කරමිනි.

ස්ත්‍රිය සැබැවින් ම ශක්තිමත් ය. ඇය එක් කාර්යයක් පමණක් නොව එකවර කාර්යයන් කිහිපයක් කළමනාකරණය කර ගැනීමට සමර්ථ වන්නීය. අනෙකා වෙනුවෙන් ඇයගේ සතුට, යෞවනය, නිදහස කැප කරන ඇය, ඇදහිය නො හැකි තරම් පරිත්‍යාගශීලී හදවතකට උරුමකම් කියන්නීය. ඔසප් වේදනාව නිසා වැඩ කටයුතු පැහැර නො හරිනුයේ එනිසා ම ය. ඇය රැකියා ස්ථාවයෙහි මසකට වරක් ඔසප් නිවාඩු ලබා ගන්නේ නැත. එසේ සිදු වූවා නම් ස්ත්‍රියකට රැකියාවක් සිදු කරමින් ආර්ථික ප්‍රතිලාභයන් උදෙසා සහ ඵලදායී සේවාවක් ලබා දීම උදෙසා කටයුතු කළ හැකි වන්නේ ද ? ගැබ්ගත් මොහොතේ පටන් නොයෙක් අපහසුතා දරා ගනිමින් පැහැදුණු සිතින් යුතුව කටයුතු කරනුයේ සීලයක් රකින පරිද්දෙනි. ඉතා පරෙස්සම් සහගතව ක්‍රියා කරන ඇය සියලු වැඩ කටයුතු නිසියාකාරව ඉටු කරමින් ස්වකීය වගකීම් පැහැර නො හරිනුයේ තම සිතිවිලි සමුච්චය ම කුසෙහි වැඩෙන දරුවා වෙත කේන්ද්‍ර කරමිනි. යහපත් සිතිවිලිවලින් සුපෝෂිත මනසක් තුළ දරුවාගේ ශාරීරික හා මානසික අංශයන්ගේ යහසංවර්ධනයට ඇය ක්‍රියා කරයි. රැකියාවක නිරත වුවු ද ඇය ගැබට මාස 07 ක් 08 ක් පමණ සපිරෙන තුරු ම තම වගකීම් ඉටු කරයි. ප්‍රසූත නිවාඩුව තුළ ද ඇය, ඉතා ම අල්ප දින ගණනක් හැර ඉතිරි සෑම දිනක ම නිවසේ දෛනික කටයුතු සිදු කරමින් දරුවන් ඇතුළු අනෙකුත් පිරිසට අවශ්‍ය සියලු දේ පිළිබඳ අවධානය යොමු කරමින් නිවැදීව හා කාර්යක්ෂමව ඉටු කරයි. ක්ෂණයකින් දුක අමතක කර සිනාසීමේ අපූරු ඖෂධය හිමි ස්ත්‍රිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු ලිංගිකත්වය පමණක් ම නොව චිත්තවේගීය විෂමතාව එහිලා ප්‍රබල සාධකයක් බව තහවුරු කරයි.

තාරුණ්‍යයේ පිබිදෙන හැඟුමන් අතරින් ජීවිතයේ නිදහස හඹා යන යෞවනියකගේ නිදහස යම් පමණකට සීමා වීමක් විවාහය තුළ සිදු වේ. ස්ත්‍රියකට ආවේණික තවත් දුක්ඛයක් ලෙස බුදුදහම පෙන්වා දී ඇත්තේ ස්වකීය මව්පිය, නෑදෑ හිතමිතුරන්ගේ ඇසුරින් මිදී දුරස් වීමට සිදු වීම ය. තම දෙමාපියන් සමීපයෙහි දියණියක, තරුණියක විඳින නිදහස අසීමිත ය. නමුත් විවාහයෙන් පසු ඇයගේ කෑම බීම, ඇඳුම පැළඳුම, ගමන බිමන පමණක් නොව ඇතැම් විට කතාබහ සහ සිනහව පවා සීමා සහිත වේ. එය කාන්තාවකට මානසික වශයෙන් යම් බලපෑමක් ඇති කරයි. නමුත් ඒ තුළ ස්ත්‍රිය, ඕනෑම තත්ත්වයක් යටතේ අකම්පිතව හැඩගැසීමටත් යළි සිනාසීමටත් දිරි වඩා ගනී. තම ළබැඳියන්ගෙන් දුරස්ථව ගෙවෙන නුහුරු පරිසරයට ඇය නිතැතින් ම හැඩගැසේ. ඒ ස්ත්‍රී චිත්ත ශක්තියයි. ඇය සියල්ල උපේක්ෂාවෙන් විඳ දරා ගනිමින් පුරුෂයාට සමානව ම සියලු කාර්යයන්හි කාර්යක්ෂම වන අතර බොහෝ අවස්ථාවල පුරුෂයා ඉක්මවමින් දෙපාර්ශවයෙහිම වගකීම් ඉටු කරනු දැකිය හැකි ය.

ආවේණික දුක්ඛ සූත්‍රයට අනුව ස්වාමියා අනුගමනය කිරීමට සුදු වීම ද ස්ත්‍රියට උරුම වූ දුක්ඛදායක තත්ත්වයකි. ස්ත්‍රියට තම සිතැඟි පරිදි නොව විවාහ වූ දින සිට ස්වාමියාට යටහත් පහත් බවින් යුතුව ස්වාමියාට අනුව ජීවත් වීමට සිදු වේ. හැඟීම් හා යෞවනය අතර ස්ත්‍රිය අපේක්ෂා කරන නිදහස් ජීවිතට යම් යම් බාධා එල්ල වීම මේ තුළ සිදු වේ. ස්වාමියාට අනුව හැඩගැසෙන ඇය ප්‍රේමණීයත්වයේ පක්ෂපාතීත්වය විදහා පාමින් සැමියා වෙනුවෙන් ස්වකීය ජීවිතයේ බොහෝමයක් දේ කැප කරමින් ඒ සියල්ල සැමියාගේ ෂතුට වෙනුවෙන් ම පිරිනමයි. තමා රුචි දේ ඒ අයුරින් ම භුක්ති විඳින්නට ස්ත්‍රියට නො ලැබෙන තරම් ය. එනමුදු ඇය සියල්ල දරාගෙන පරාර්ථකාමීත්වය ප්‍රදර්ශනය කරනුයේ අපරිමිත ආදරයත් හෘදයාංගම බැඳීමත් සමග තම සැමියාගේ ජීවිතයට ශක්තිමත් ම වාරුව බවට පත්වෙමිනි. ඒ තුළ වඩාත් සුවිශේෂී වනුයේ එම ශක්තිමත් වාරුව නිබඳව ම කායික හා මානසික යන අංශද්වය ම ආවරණය කිරීම ය. ලිංගිකත්වය තුළ හා බාහිර සමාජ ආකල්පයන්ට අභියෝග කරමින් ස්ත්‍රිය, ඇයගේ අසහාය මනෝමය චර්යා රටාව මගින් ලෝකයක් නිර්මාණය කරන්නී, පුරුෂයාට සම වුත් ඇතැම් පැතිකඩයන් යටතේ පුරුෂයා පසු කළ දියුණු තත්ත්වයන් ප්‍රකට කරන්නා වූත් ස්වාභාවයක් නියෝජනය කරයි.

මෙම දුක්ඛදායක තත්ත්වයන්, මනෝවිද්‍යාත්මක පසුබිමක් තුළ ස්ත්‍රිය හා පුරුෂයා අතර විෂමතාවක් ගොඩනැඟීමට සමත් වන අයුරු අපට තහවුරු කරගත හැකි ය. පුරුෂයා රැකියාව පමණක් සිදු කළ ද ස්ත්‍රිය ඉහත දුක් සියල්ල දරා ගනිමින් සැමියාගේත් දරුවන්ගේත් ඥාතීන්ගේත් නිවසේත් මෙන් ම රැකියා ස්ථානයේත් සෑම කර්තව්‍යයක් ම මනාව ඉටු කරයි. ඒ ඇයගේ සියුමැලි, සුලලිත ස්වරූපය ශක්තිමත් අලංකාරවත් හා විශ්මිත වූවක් ලෙසින් අර්ථවත් කරමිනි.

ස්ත්‍රියකගේ මානසික පීඩනය හා මානසික ක්‍රියාකාරී වේගය අධික ය. ඒ ඇයගේ නෛසර්ගික මෙන් ම සමාජයීය දුක්ඛයන් සේ ම ඇයට නිතැතින් ම පැවරී ඇති වගකීම් සමුදාය හේතුවෙනි. විඳින්නා වූ කඳුළුත් සිනහවත් ක්ෂණයෙන් හුවමාරු කරන ඇය තවකෙකු වෙනුවෙන් ජීවිතය පවා කැප කරයි. කෙතරම් බාධක පැමිණිය ද ඇය ජීවිතය අත් නො හරින ස්වාභාවය අවම වනුයේ එනිසා ය. ඇය මොහොතක් පාසා ම තම සමියා හෝ දරුවන් පිළිබඳව සිතමින් දෙපාර්ශවයේ ම ඥාතිමිත්‍රාදීන්ට ද සිනහවෙන් සංග්‍රහ කරනුයේ තම ළය ඇවිලෙන ගිනි මතින් අනෙකා දවාලන්නට තරම් නරුම නොවන මනුෂ්‍යත්වයේ සැබෑ ම අරුත සුවිශද කරමිනි.

බොහෝ අවස්ථාවල පුරුෂයා සිදු කරන සියලු ම කාර්යයන් ඉටු කිරීමේ හැකියාව ස්ත්‍රියට පවතී. ඇයගේ චිත්ත ශක්තිය බලසම්පන්න ය. නූතනය දෙස විමර්ශනාත්මක දෘෂ්ටියන් යොමු කිරීමේ දී ස්ත්‍රිය නො කරන කාර්යයක් නොමැති තරම් ය. ඇය, හදවත ගිනි ගන්නා දුක්ඛ සමුදායක් බලාපොරොත්තුවේ සිනහවෙන් හා පරිත්‍යාගශීලීත්වයේ ධෛර්යයෙන් යටපත් කර ගනිමින් නො පැකිලව සියලු කටයුතු සිදු කරනු දැකගත හැකි ය. ස්ත්‍රිය, පුරුෂයාට සාපේක්ෂව ශරීර ප්‍රමාණයෙන්, ශරීර ශක්තියෙන් හා රළු බවින් අඩු අගයක් නියෝජනය කරන නමුත් පුරුෂයාගේ කාය ශක්තිය ඉක්මවූ චිත්තවේගීය ශක්තියක් ස්ත්‍රිය සතු වේ. ඇයගේ ජීව ශක්තිය ද එම චිත්ත ධෛර්යය ම වේ.

කාන්තාව ආතතිය ('*Stress*'), කාංසාව ('*Anxiety*') වැනි මනෝරෝග තත්ත්වයන්ට ගොදුරු වීම සාමාන්‍ය තත්ත්වයකි. භීතිකා තත්ත්වයන් ('*Phobia*') ද එසේ ම ය. ඒ ඇයගේ පීඩිත මනෝමය ක්‍රියාකාරීත්වය නිසාවෙනි. නමුත් මෙම මනෝරෝග තත්ත්වයන් අසාමාන්‍ය/ දුස්සමාහිත

චර්යාවන් ('*Abnormal Behaviours*') දක්වා වර්ධනය වීමක් සිදුවීමේ සාපේක්ෂ සම්භාවිතාව අඩු ය. ඒ සඳහා විවාහක කාන්තාවන් ස්වකීය ස්වාමියා පිළිබඳව සිතීමත් විශේෂයෙන් ම දරුවන් පිළිබඳව සිතා ජීවත් වීමත් හේතු වනු දැකිය හැකි ය. කෙතරම් දුර්භාග්‍ය තත්ත්වයන් හමුවේ වුව ද තම දරුවාට දක්වන සෙනෙහසෙහි අංශු මාත්‍රයක හෝ අඩුවක් නොමැත. ඇයගේ චිත්තවේගීය වර්ධනයෙහි යහපත් අංශයෙහි උසස් තත්ත්වයන් මත කරුණාවත් මෛත්‍රියත් කැටි වූ අසීමිත දාරක ස්නේහය නිසා ම රක්ත වර්ණ රුධිරය ශ්වේත වර්ණ ක්ෂීරයට පරිවර්තනය වී තවත් ආත්මයකට ප්‍රාණය සදාලන්නේ එනිසාවෙනි. දරුවා නිරන්තරයෙන් ම හද දරාගෙන බිළිඳා නිරන්තරයෙන් තෘප්තිමත් කරන ඇය තම ළය ගිනි, මානසික පීඩාවන් දරුවාගේ දර්ශන මාත්‍රයෙන් නිවා ගනී. ගැහැණිය ලොවක් ජීවත් කරවයි. සනහයි. ඒ ඇයගේ කායික සැකැස්මක් මත නොව පැහැදිලිව ම ඇයගේ චිත්තාභ්‍යන්තරික මනෝ රටාවන්ගේ සුවිශේෂත්වයන් හේතුවෙනි.

ආවේණික දුක්ඛ සූත්‍රය, හුදු ස්ත්‍රී ජන්ම ලාභය මත උරුම වන නෛසර්ගිකමය හා අවශේෂ වූ සාධකයන් පිළිබඳව විවරණය කරනු ලබන සූත්‍ර දේශනාවක් නොවේ. එය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විෂයෙහි ලිංගිකමය සාධකය පමණක් ම හේතු නො වන බව පෙන්වා දෙන්නකි. ලිංගිකත්වය, ස්ත්‍රියත් පුරුෂයාත් අතර විෂමතාව ප්‍රකට කරන ප්‍රධානතම සාධකය වේ. නමුත් එය වඩාත් ශක්තිමත් හා අර්ථවත් වනුයේ මනෝවිද්‍යානුකූල පදනමක් මත හිඳ විමර්ශනය කිරීමේ දී අනාවරණය වන චිත්තවේගීය පරතරය මතින් ය. ඉවසීම, දරාගැනීම, අකම්පිත බව, සංවේදීත්වය වැනි සාධකයන් මෙන් ම කළමනාකරණය, පරාර්ථකාමීත්වය, නම්‍යශීලීත්වය වැනි උත්තුංග ගුළාංගයන්ගෙන් ද පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය දුක්ඛිත තත්ත්වයන්ගෙන් යළි නැගී සිටීම මනාව ඉස්මතු කරන අසහාය වූ අකම්පිත ශක්‍යතාව විශිෂ්ට ය. ඇය ඕනෑම පසුබිමක් තුළ මනෝ ව්‍යාකූලත්වයකින් තොරව උපේක්ෂා සහගතව ජීවත් වීමට සමත් වේ. තව ද ඇය කිසිදු අවස්ථාවක එක් කාර්යයකට පමණක් සීමා නොවී බහුකාර්ය; එමෙන් ම සමබර වූ නම්‍යශීලී මානසිකත්වයකින් යුතුව කටයුතු කරයි. මේ සියල්ල භෞතිකමය සාධක නිසා සිදු නොවේ. අප අවධානය යොමු නොකරන අභෞතිකමය දෘෂ්ටිකෝණය යටතේ (ස්ත්‍රියගේ හා පුරුෂයාගේ මානසික ක්‍රියාකාරීත්වය) මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි ප්‍රබල තීරණාත්මක සාධකයක් ගොඩනැගී ඇති බව තහවුරු කරගත හැකි ය. වත්මන් සමාජය දෙස විමර්ශනාත්මක දෘෂ්ටියක් යොමු කිරීම මගින් ද මේ බව මනාව පැහැදිලි වේ.

**සමාලෝචනය**

මේ අනුව ආවේණික දුක්ඛ සූත්‍රය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විෂයෙහි සෘජුව අදාළ වන සූත්‍ර දේශනාවක් වන අතර එය බුදුදහම තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙතරම් පුළුල් පර්යේෂණාත්මක දෘෂ්ටියකින් විග්‍රහ කර තිබේදැ යි හඟවන්නකි. බුදුදහම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විෂයෙහි ලිංගිකත්වය ප්‍රබල ම සාධකය බව පිළිගනී. ඒ බව බොහෝ සූත්‍ර දේශනාවන් මගින් තහවුරු කරගත හැකි ය. යථෝක්ත කරුණු අනුව ලිංගිකත්වය තරමට ම ප්‍රබලව පුද්ගලයාගේ මනෝමය ක්‍රියාකාරීත්වය එහිලා ප්‍රමුඛ විෂමතාවන් ප්‍රදර්ශනය වීමට හේතු වන අයුරු හඳුනාගත හැකි ය. ආවේණිකදුක්ඛ සූත්‍රය මගින් කාන්තාවකට හිමි නෛසර්ගිකමය හා අවශේෂ දුක්ඛදායක අනන්‍යතාවන් තුළ ඇයගේ මානසිකත්වය තුළ සිදු වන අභිප්‍රේරණාත්මක ස්වාභාවය මුසු වූ අතිශය ප්‍රබල විපර්යාස තත්ත්වයන් හේතුවෙන් ස්ත්‍රීත්වය හා පුරුෂත්වය අතර පැහැදිලි වෙනසක් ගොඩනගන්නට සමර්ථ වේ. කාය ශක්තියට අභියෝග කරමින් සැමවිටම ස්ත්‍රිය, ඉවසීමේ හා දරා ගැනීමේ ශක්‍යතාව තුළ පුරුෂයන්ට සාපේක්ෂව ඉදිරියෙන් සිටිමින් ජීවිතයේ සියලු පැතිකඩ ආවරණය කර ගන්නා බව සහේතුකව තහවුරු කරගත හැකි ය.

ආවේණික දුක්ඛ සූත්‍රාගත කාරණාවන් විචාරාත්මක අධ්‍යයනයක් තුළ ඒ වෙත විමර්ශනාත්මක දෘෂ්ටියක් යොමු කිරීමේ දී ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකයක් ලෙස ස්ත්‍රීත්වයට අනන්‍ය වූ දුක්ඛයන්ගේ බලපෑම සෘජු වූවක් බවත් එය වඩාත් ශක්තිමත් මනෝවිද්‍යාත්මක පදනමක් අර්ථවත් කරන බවත් නිගමනය කළ හැකි ය. ඒ අනුව ස්ත්‍රියකට පමණක් ආවේණික වූ දුක්ඛදායක තත්ත්වයන් සියල්ල; ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි තීරණාත්මක සාධකයක් ලෙසින් සෘජුව බලපෑම් එල්ල කරන බව සහේතුකව සනාථ කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ආවේණිකදුක්ඛ සූත්‍රය*, සංයුත්තනිකාය 04, (2006), බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 16, ශ්‍රී ලංකා ජනරජය.

*මහාතණ්හාසඞ්ඛය සූත්‍රය*, මජ්ඣිමනිකාය 01, (2006), බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 10, ශ්‍රී ලංකා ජනරජය.

*Chaṭṭa Saṅgāyana Ṭipiṭaka 4.0*

https://si.wikipedia.org/wiki/

https://www.thripitakaya.org/sutta/index/137

https://www.thripitakaya.org/tipitakaya/Index/129?s=1764